# ඕල්කට් බෞද්ධයෝ හා සෝබන ජාතික ව්‍යාපාරය

පෘතුගීසීන් මෙරටට පැමිණ අප නැතිකිරීමට කටයුතුකිරීමෙන් පසු ව මෙරට යටත්විජිත විරෝධී හා නිදහස් සටන් පිළිබඳ ඉතිහාසයේ යුද්ධ දක්ෂයන් වූ සීතාවක රාජසිංහ හා විමලධර්මසූරිය රජවරුන් එකිනෙකා සමග සටන් නොකර සමගිව සිටියේ නම් ඇතැම්විට කිසිම යුරෝපීය ජාතියකට අප යටත් කරගැනීමට නොහැකිවීම සඳහා පදනමක් දමාගැනීමට තිබුණි. එවැනි අග්‍රගණ්‍ය යුද්ධ දක්ෂයන් දෙදෙනකු එකම කාලයේ රටේ බිහිවීම ම අරුමයකි. ඔවුන් එකිනෙකා සමග සටන් කිරීමෙන් පසුව ද දෙදෙනාම වෙන වෙන ම පෘතුගීසීන්ට හතිවැටෙන තුරු පහර දුන්නේ වෙනත් කිසිම ආසියාතික හෝ අප්‍රිකානු හෝ ජාතියක් නොකළ අයුරින් ය. ඔවුහු කිනම් අඩුපාඩුකම් තිබුණ ද අව්‍යාජ ජාති හිතෛෂීහු වූහ. විමලධර්මසූරිය රජු මියගොස් මේ වසරට වසර හාරසීයක් සම්පූර්ණ වෙයි. සෝබනයට, ප්‍රදර්ශනයට ජාතික ව්‍යාපාරයේ යෙදීමක් එකල නො වීය. එමෙන් ම සෝබනයෙන් හා ප්‍රදර්ශනාත්මක (සංදර්ශනාත්මක) ක්‍රියාවලින් ජාතික ව්‍යාපාරය ගොඩනැගීමක් ගැන ද ඔවුහු නො සිතූහ. අද වැඩිපුර ම ඇත්තේ සංදර්ශනාත්මක ව්‍යාජ ජාතික ව්‍යාපාරයකි. එහි රඟපෑම්, කෑකෝ ගැසීම්, උප්පරවැට්ටි හා මල්වට්ටි දකින්නට ඇත. ව්‍යාජය කෙතරම් ද යත් අඩුම තරමින් විශ්ව විද්‍යාලයක ආධුනික කථිකාචාර්යවරයකුවීම සඳහා අවම සුදුසුකම් හෝ නැති, මහා ප්‍රාඥයකු ලෙස පෙනී සිටින තුට්ටු දෙකේ උගතෙක් තමා විශ්ව විද්‍යාල ආචාර්යධුරය පරිත්‍යාගකර දේශපාලනයේ යෙදෙනබව අන්ධ අනුගාමිකයන්ට එත්තුගන්වයි. අන්ධ අනුගාමිකයන් අතර කසිකබල් මහාචාර්යවරු තුන්හතර දෙනකු ද සිටීමෙන් පෙන්නුම් කරන්නේ මහාචාර්ය ධුරවලට නුසුදුස්සන් ද පත්වී ඇති ආකාරය ය. මේ ඊනියා ප්‍රාඥයාට අනුව මගේ දේශපාලනය පීඨාධිපතිවරයකු වීමේ අවශ්‍යතාව විසින් මෙහෙයවෙයි. විශ්ව විද්‍යාලයේ කථිකාචාර්යවරයකු ලෙස සේවය කෙළේ යැයි අඟවන මොහු අංශාධිපතිවරයකු නොවන්නකුට පීඨාධිපතිවරයකුවීමට නොහැකි බවවත් නොදනියි. අර කසිකබල් මහාචාර්යවරයකු හෝ ඔහුට ඒ බව කියාදෙන්නේ නම් මැනවි. මේ සෝබනකාරයන් දැන් විමලධර්මසූරිය රජුගේ හාරසිය සංවත්සරය සැමරීමට ඉදිරිපත්වීමට ද බැරි නැත. ජාතික ව්‍යාපාරය එවැනි සංදර්ශනාත්මක නැතහොත් ව්‍යාජ මගක් ගැනීම පිළිබඳ විස්තරාත්මක ව පිළිවෙළින් ලිවියයුතු මුත් මේ තීරුවෙහි පළවන්නේ තැනින් තැනින් ලියැවෙන සටහන් කිහිපයක් පමණකි.

මෙරට ජාතික ව්‍යාපාරයෙහි අවසන් වරට සිංහලයන්ගේ නායකයන් ලෙස භික්ෂූන් වහන්සේ විසින් පත්කරනු ලැබුයේ පුරං අප්පු හා ගොංගාලේගොඩ බණ්ඩා ය. ඉන්පසු එවැනි නායකත්වයක් බිහි කිරීමට භික්ෂූන් වහන්සේට නොහැකි විය. එවැනි නායකත්වයක් සඳහා කිට්ටුවට හෝ පැමිණියේ අනගාරික ධර්මපාලතුමා ය. අකුරු කියවීමට මිසක් අකුරුවලින් කියැවෙන දෙය කියවීමට අසමත් පඬියකු සිංහල බෞද්ධ විරෝධී සතිඅන්ත පත්තර කඩමාල්ලකට ලියමින් අනගාරික ධර්මපාලතුමාගේ ජීවිතයේ අවසාන භාගයෙන් කරුණු ඉදිරිපත්කරමින් කියා ඇත්තේ අනගාරික ධර්මපාලතුමා ඉන්දියාවට ගියේ තිස් ගණන්වලින් පසුව බව ය. අපට ප්‍රශ්නය වනුයේ ඕල්කට් බෞද්ධයන් එතුමාට පහරදීම නිසා රට අත්හැර යා යුතු යැයි එතුමා තීරණය කෙළේ කවදා ද යන්නත් ඒ තීරණය අනුව එතුමා ඉන්දියාවට පළමුවෙන් ගියේ කවදාද යන්නත් ය. මා විසින් කලින් දිනෙක උපුටා දක්වන ලද කොටස් අනුව එතුමාට රට අත්හැර යෑමට අවශ්‍ය වූයේ 1912 දී ය. ධර්මපාලතුමාගේ යටත්විජිත විරෝධී සටනේ කෙතරම් දුර්වල කම් තිබුණ ද එතුමාට බ්‍රිතානි යටත්විජිතවාදීන් භය වූ අන්දම ඕනෑම පඬියකුට එකල පොලිස් වාර්තාවලින් දැනගත දැකගතහැකි ය.

ඕල්කට් බෞද්ධයන් යනු කවුදැයි කලින් කියා ඇතිමුත් ඇතැමකුට මේ වන වට ඒ අමතක වී ඇත. ඕල්කට් බෞද්ධයා යනු ආගමින් බෞද්ධ එහෙත් සංස්කෘතියෙන්, විශේෂයෙන් ම වෘත්තියෙන් ක්‍රිස්තියානි වූ පුද්ගලයෙකි. බුද්ධාගම හුදු ආගමක් බවට පත්කෙරුණේ මොවුන් අතින් ය. බුද්ධ ශාසනයෙහි ආගමික පක්ෂයක් නැතිවා නො වෙයි. එහෙත් එය රෙපරමාදු ක්‍රිස්තියානිය මෙන් හුදු ආගමක් ලෙස ඇදහිය හැකි නො වෙයි. බටහිර ක්‍රිස්තියානි සංස්කෘතියෙහි ආගම, වෘත්තියෙන්, රාජ්‍ය පරිපාලනයෙන් ආදියෙන් නාමික ව මතුපිටින් වෙන්කළ හැකි ය. මේ වෙන්කිරීම බටහිර ක්‍රිස්තියානි නූතනත්වයෙහි එක් අංගයක් වෙයි. පහළොස්වැනි සියවසේ පමණ යුරෝපයේ ඇරඹි මේ ක්‍රියාවලිය අද වනවිට තවත් සීඝ්‍රයෙන් කෙරීගෙන යයි. නූතනත්වයේ ම ඒ ක්‍රියාවලිය බටහිර ඇතැම් උගතුන් විසින් ඊනියා පශ්චාත්නූතනත්වයක් ලෙස හැඳින්වෙයි. මෙරට හීනමානයෙන් උතුරාගිය ඉංගිරිසි හෝ සිංහල හෝ නොදත් කිහිපදෙනකු පශ්චාත්නූතනවාදී ගිරා පෝතකයන් වී ඇති අයුරු දැකගත හැකි ය. ක්‍රිස්තියානි සංස්කෘතියෙහි ඇත්තේ ඉහත සඳහන් පරිදි නාමික ව පමණක් කෙරෙන වෙන්කිරීමකි. එහෙත් බටහිර බුද්ධිමත්තු මේ නාමික වෙන්කිරීම ගැඹුරින් කෙරෙන වෙන්කිරීමක් ලෙස

© Prof. Nalin De Silva

ගෙන බටහිර වෛද්‍ය විද්‍යාව හෝ බටහිර ගණිතය හෝ රාජ්‍යය හෝ බටහිර නීතිය හෝ වෙනත් එවැන්නක් ආගමෙන් වෙන්වී ඇතැයි තර්ක කරති. (බටහිර විද්‍යාවේ ඇති ක්‍රිස්තියානිය තේරුම්ගැනීමට විද්‍යා කතන්දර පොත කියවන්න.) මෙරට ඕල්කට් බෞද්ධයන් ද ඔවුන් අනුකරණයෙහි යෙදෙමින් ආගම වෘත්තියෙන් වෙන්කරනු දැකිය හැකි ය. අද බුද්ධාගම පාංශුකූලයට, දානයට, පිරිතට, මල්වට්ටියට හා උප්පරවැට්ටියට සීමා වී ඇත්නම් එසේ කිරීමේ වරද පැටවෙන්නේ බුද්ධාගම සංස්කෘතියෙන් වෙන්කළ ඕල්කට් බෞද්ධයන්ට ය.

මෙරට ව්‍යාජ ජාතික ව්‍යාපාරයක් දහනමවැනි සියවස අගභාගයේ සිට ගොඩනැගුණේ ඕල්කට් බෞද්ධයන්ගේ අනුග්‍රහයෙන් ය. මේ ව්‍යාජත්වය අද ඔඩුදුවා ගොස් ය. පාර්ලිමේන්තු ගිය භික්ෂූන් වහන්සේ (ආණ්ඩු පක්ෂයට ගිය දෙනම ද ඇතුළුව) අලජ්ජී භික්ෂූහු වෙති. පසුගිය දිනක මේ අලජ්ජී භික්ෂූන් එලෙස හැඳින්වූවිට ඕල්කට් බෞද්ධයන් පිරිසක් අවි අමෝරා ගෙන (වාචික ව) මා වෙත කඩා පැන්නෝ ය. එක් ඕල්කට් බෞද්ධයෙක් තමන් එවැනි වචනයක් පාවිච්චි නොකරන බව කීමට තරම් ශ්‍රද්ධාසම්පන්න වෘතයක් අනුගමනය කරන්නෙක් ලෙස පෙනී සිටියේ ය. බෞද්ධ සාහිත්‍යයෙහි අලජ්ජී භික්ෂූන් යන වචනය යොදාගෙන තිබෙනවා පමණක් නොව අශෝක රජු මෙන් ම සිංහල බෞද්ධ රජවරුන් ද අලජ්ජී භික්ෂූන්ට දඬුවම් කර ඇති බව ද සඳහන් වෙයි. මෙයින් අදහස් වන්නේ පසුගිය දා පාර්ලිමේන්තු මන්ත්‍රීවරු පිරිසක් මන්ත්‍රී හාමුදුරුවරුන්ට සැළකූ ආකාරය නිවැරදි ය යන්න නො වෙයි. කිසිදු විවේචනයකින් තොරව බටහිර ක්‍රිස්තියානි විද්‍යාව ඉගැන්වීම තම වෘත්තිය බවට පත්කරගත් එක් ඕල්කට් බෞද්ධයෙක් අලජ්ජී යන වචනය යොදාගැනීමට මට අයිතියක් නැතැයි යනුවෙන් තකතීරු කතාවක් කෙළේ ය. මේ ඕල්කට් බෞද්ධයාට අනුව ධර්මපාලතුමාට එවැනි වචන පාවිච්චිකළ හැකි නමුත් මට එසේ කිරීම තහනම් ය. අම්ලයකට අම්ලයක් යැයි කිවහැක්කේ භෂ්මයකට පමණක් ය යන ආකාරයේ තර්කයක් එහි අඩංගුවනවා විය හැකි ය. අද ඕල්කට් බෞද්ධයෝ මගේ මාක්ස්වාදී අතීතය ද ප්‍රශ්න කරති. ඒ සෝම හාමුදුරුවන් නමින් ලැබුණු ඡන්දවල ශක්තියෙන් ය. එහෙත් ඕල්කට් බෞද්ධයෝ ජනතා මිතුරන්ගෙන් පැමිණි තම නායකයන්ගේ මාක්ස්වාදී අතීතය අමතක කිරීමට තරම් නහී වේරෙන වේරානි වෙති.

අද තිබෙන සෝබන ජාතික ව්‍යාපාරය උත්සන්නවූයේ සෝම හාමුදුරුවන්ගේ අපවත්වීමෙන් පසුව ය. සෝම හාමුදුරුවන්ගේ ව්‍යාපාරය පිළිබඳ ව නිසි ඇගයීමක් කිරීමට අපට නො හැකි විය. එහෙත් අතරින් පතර අප කියා ඇත්තේ උන්වහන්සේ ඇතැම් අවස්ථාවල සිංහල බෞද්ධ සංස්කෘතියට විරුද්ධව හේතුවාදී බුද්ධ ධර්මයක් දේශනා කළ බව ය. ඒ බව උන්වහන්සේ අපවත් වීමට පෙර ද අප කියා ඇත. සෝම හාමුදුරුවෝ ජනාධිපති ධුරය සඳහා තරගකරන බවක් වදාළහ. අපේ රටේ තමන් දන්නා තොරතුරු ද කීමට බොහෝ දෙනා පසුබට වෙති. අප දන්නා තරමින් සෝම හාමුදුරුවන්ගේ දේශපාලනයට අපවත් වී වදාළ මඩිහේ මහානායක හිමියන්ගෙන් අනුබලයක් හෝ අනුග්‍රහයක් හෝ නො ලැබිණි. සෝම හාමුදුරුවන්ට තමන්වහන්සේගේ දේශපාලනය දිගට ම කරන්නේ නම් මහරගම ධර්මායතනයෙහි වැඩවිසීම ප්‍රශ්නයක් වන තත්ත්වයකට පත්ව තිබූ බව තතු දන්නෝ පවසති. සෝම හාමුදුරුවන්ට වෙනත් විහාරස්ථානයක අවශ්‍යතාව පැන නැගුණේ ඉන් පසුව ය. උන්වහන්සේට රුසියාවට වැඩම කිරීමට සිදුවූයේ ද එලෙස විහාරස්ථානයක් ගොඩනගාගැනීමට අවශ්‍ය මුදල් සපයාගැනීම ප්‍රශ්නයක් වී තිබුණු බැවින් ය. රුසියාවේ දී උන්වහන්සේ අපවත් නොවන්නට සිදු වීමට තිබුණේ කුමක් ද? අද සෝබන ජාතික ව්‍යාපාරයේ නායකත්වයේ අය උන්වහන්සේ ජීවත් ව සිටි කාලයේ දී ක්‍රියා කෙළේ උන්වහන්සේ සමග එකඟත්වයකින් නොවන බව ද තතු දන්නෝ දනිති. උන්වහන්සේගේ විවේචනයට හසුවූවෝ අද සෝබන ජාතික ව්‍යාපාරයේ නායකත්ව ධුරවලට පත් වී සිටිති. සෝම හාමුදුරුවන් අපවත්වන සමයේ උන්වහන්සේගේ ජනප්‍රියත්වය අඩුවෙමින් පැවතුණු බව ද රහසක් නො වෙයි. කෙසේ වෙතත් උන්වහන්සේ අපවත්වීමෙන් පසුව උන්වහන්සේගේ නාමය වටා තරමක ජනරැල්ලක් ඇතිවිය. යම් අයුරකින් උන්වහන්සේ ජනාධිපති ධුරයට තරග කෙළේ නම් උන්වහන්සේට ඡන්ද කීයක් ලැබෙන්නට තිබිණි දැයි නිශ්චිත ව කිවහැකි නොවුවත් අපවත් වූ සෝම හාමුදුරුවන්ගේ නමින් ඡන්ද ලක්ෂ ගණනක් තිබුණු බව නම් පැහැදිලි විය. සෝම හාමුදුරුවන්ගේ විවේචනයට හසු වූවෝ උන්වහන්සේගේ අපවත්වීමෙන් පසුව ඇතිවූ ජනරැල්ල අවස්ථාවාදීව හා අලජ්ජීව යොදාගැනීමට කටයුතු කළහ. භික්ෂූන් වහන්සේ පාර්ලිමේන්තු වැඩියේ එසේ ය. එහෙත් තේරුම්ගැනීමට ඇති දෙයක් වෙයි. ඒ සෝම හිමියන්ගේ නාමයෙන් ජනරැල්ලක් ඇතිවූයේ කෙසේ ද යන්න ය.

© Prof. Nalin De Silva